උපේක්ෂා සේනානායක ලියයි

# ප්‍රතිබිම්බ 15

මෙල්බර්න් නගරය මං බලාපොරොත්තු වුණාට වඩා මාව බලාපොරොත්තු වෙලා තිබුණා. දන්න හඳුනන මුහුණු මහ ගොඩයි. කන්න දෙන්න උදව්විය මහ ගොඩයි. මට මං වෙනුවෙන් දිනයක් වෙන් කරගන්න බොහොම අපහසු වුණා. කොහොමත්

මං ලංකාවෙන් එන්න දවස් දෙකකට කලින් ආර්තී බලන්න ගිය වෙලේ නිල්හාන් මට කිව්වෙ "මචං මේ අපේ ලේන් එකේ ගෙවල් වල හිටිය පොඩි කොල්ලො කෙල්ලො ඔක්කොම දැන් මෙල්බර්න් වල ලක්ෂෙට කොඩිදාලා ඉන්නෙ. ඒ නිසා උඹ නම්බුවට කෙළ වෙන වැඩ එහෙම කරන්න එපා. ඒවා වයිබර් හරි ස්කයිප් හරි දිගේ හැරෙන තැපෑලෙන් මෙහෙට එයි. අන්තිමට උඹ එද්දි අපිට මෙහේ යන එන මං නැතිවෙලා තියෙයි පුතෝ" කියලා. නිල්හාන් කවට කමට ඒක කිව්වත් ඒ කතාව ඇත්ත තමයි කියලා මට ත් හිතෙනවා. එක දීර්ග සති අන්තයක් එලඹෙන්න නියමිත සිකුරාදාවක මං සාප්පු සංකීර්ණයකට ගොඩවෙන්න හිතාගෙන එලියට බහිද්දි හීන් පොද වැස්සක් වහින්න ගත්තා.මං මගක් දුර යද්දි ඒ හීන් වැස්ස මහ වරුසාවකට පෙරළුණා.ඒත් මං මග නතර නොවී දිගටම ගියේ නැවත වෙලාවක් මේ වෙනුවෙන් හොයා ගන්න බැරිවෙයි කියලා හිතුණ නිසා. සාප්පු සංකීර්ණයේ රථ ගාලට මං ඇතුළු වෙද්දි වැස්ස තරමක් තුරල් කරල තිබුණ නිසා මං උවමනාවෙන්ම තරමක් වේගෙන් ඇවිත් තිබුණ නිසා යුවතියක් පාර පනින්න හදද්දි තරමක් තදින් තිරිංග තද කරන්න මට සිද්දවුණා. ඒත් එක්කම ඒ යුවතිය හිස ඔසවලා මං දිහා බැලුවා. දෙවියනේ ඒ දුලිනි. රිදීපාට උණුසුම් කබායක් ඇඳලා සුදු සහ ලා අළු පැහැය මිශ්‍රිත සිනිඳු සළුවක් ගෙල වටේ සී-රුවට ඔතලා උණුසුම් පාවහන් පැලඳලා මං දිහා බලං හිටියා.

මට මතක් වුණේ රුසියානු නවකථාවක්.ඇය කඩිනමින් පාර මාරුවෙලා ඉස්සර වගේම අර අවුරුදු ගානකට පෙර සිදුවුණා වගේ ම ඇය අතුරුදහන් වුණා.
මනහාරි එදා මට කිව්වෙ ඒගොල්ලො ඉන්නෙ බෙරික් කියලා. ඒ කියන්නෙ මං නැවතිලා ඉන්න පළාත ඊට කිට්ටු එක්කද. අන්තර්ජාලයෙන් මේ ඉසව් දෙක අතර පරතරය හොයාගන්න හිතාගෙන මං " ග්ලෝරියා ජීන්ස්" කෝපි හලකට ඇතුළු වෙලා ලාටේ කෝප්පයක් ඇනවුම් කළා.දුම් දමන උණුසුම් කෝපි සුවඳ අතරෙ මං හොයාගත්තා බෙරික් සහ මා නැවතී සිටින කීස්බරෝ අතරෙ රිය ගමනට ගත වෙන්නෙ මිනිත්තු විස්සක් වගේ කාලයක් කියලා. පලවෙනි ලාටේ උගුර බීලා මං මනහාරිට ඇමතුමක් ගත්තා. ඇය හිටියෙ ඉස්සො කිරිහොද්දක් හැඳිගාමින්.

"හලෝ ඉඳුවර අංකල් කොහොමද ජීවිතේ" මනහාරි බොහොම විවෘතව මගේ නම කියලා කථා කරේ දුලිනි තාම ගෙදර ගිහින් නැති නිසා වෙන්නැති. මං ඇයට ඉතාම සංක්ෂිප්තව දුලිනිව මුණ ගැහුණු බව දැනුම්දුන්නා.

"මං ලඟදි බැලරාට් යනව අංකල් මගේ පුහුණුවකට. පුංචි මට එහෙ ගියාම අඳින්න ස්වීටර් එකක් ගොත ගොතා හිටියෙ.ඒකෙ එක පාටක නූල් ඉවරයි කිව්වා.ඒ නූල් හො යන්න යන්න ඇති. ඒකයි ඔය පැත්තට යන්න ඇත්තෙ"

මට දුලිනි ගැන අනුකම්පාවකට කිට්ටු හැඟීමක් ඇතිවුණා. එයා මනාහාරිව තමන්ගෙ දරුවෙක් වගේ රැකබලාගන්නවා ඇති. මේ දීර්ග සති අන්තෙ කෙසේ හෝ දුලිනිව මුණ ගැහෙන්න යන්න මං හිතාගත්තා. දහසක් බලාපොරොත්තු හිතේ ගුලි ගැහෙද්දි මගේ කෝපි බඳුන හිස්වෙලා තිබුණා.

මනහාරි බැලරාට් බලා පිටත්ව ගිය දින හැන්දෑවේ දුලිනිව මුණ ගැසෙන්නට මට උවමනා විය. මම පීච් ගෙඩි වල පැහැය හොරාගත් මගේ ප්‍රියතම කමිසය පිටතට ගෙන මදින්නට පටන් ගත්තා. ඒ කමිසෙ කොලරයේ ඇතුළු පැත්ත සහ අත්වල කෙළවර ඇතුළු පැති අළු පාටින් කොටු යොදලා තිබුණා. ඒ කමිසෙට කළු කලිසම හොඳින් ගැලපුණා. මහ මෙරක් තරමට ආදාරේ කළාට දුලිනි කැමති මොන වගේ දේවල් වලටද කියලා පුංචිම අවබෝධයක් වත් මට තිබුණෙ නැහැ. මං ඒ නිසා ලංකාවෙන් එද්දි අරං ආපු "තාරා මගේ දෙව්දුව" පොතේ කොපියක් ඇය වෙනුවෙන් අරං යන්න හිතුවා. මගේ "රෝයල් මිරාජ්" සුවඳ කුප්පියෙන් යහමින් සුවඳපැන් ඉහගෙන මං පිටත්වුණේ සසංක අන්තිමට ලියපු කවියත්

මං සෝපාවෙ හිඳගත්තෙ ඇය විශ්මයෙන් මා දිහා බලං ඉන්න අතරෙයි.



සාක්කුවෙ දාගෙන.

දුලිනි මාව දැකලා ආපහු දොර වහගනීද නැත්තං මාව පිලිගනීද කියලා මට හිතාගන්න බැරිවුණා. කොහොමවුණත් ඒ ගෙදර මංතීරුවෙ රථය ගාල් කරද්දි මගේ පපුව ගැහෙන්න ගත්තා. චීන ආරාමෙක වගේ වත්තෙ අරුක්කු බැඳලා මල් වවලා තිබුණා. ගොඩක්ම තිබුණෙ ලැවන්ඩර් වර්ග. ගෙට ඇතුළු වෙන තැන පුංචි ගන්ඨාරයක් සවිකරලා තිබුණා. මං ඒක නාද කරලා ටික වෙලාවකින් දුලිනි ඇවිත් දොර විවර කරා. මාව දැකලා ඇයට අදහගන්න බැරිවුණා. ඇය මං දිහා බලං හිටියෙ පුදුමය , භය සහ නොසන්සුන්කම මිශ්‍ර හැඟීමකින්. බැරිම තැන මං ඇතුලට එන්න ඇහුවා.

මගේ හිතේ තිබුණ චකිතය ඒ වෙද්දි ඈත්වෙලා ගිහිං තිබුණා. මං සෝපාවෙ හිඳගත්තෙ ඇය විශ්මයෙන් මා දිහා බලං ඉන්න අතරෙයි.

"ඔයත් ඉඳගන්න"

ඇය අඩමානෙට පුටුවක වාඩිවුණේ විලිකුන් දඹයක් තරමට මුහුණ රතුවෙලා තියෙද්දි. ඉතාම සැහැල්ලු උණුසුම් ඇඳුමකින් සැරසිලා හිටිය ඇය විශ්ව විද්‍යාල සමයේ හිටියාට වඩා ස්වල්පයක් පිරිපුන් වී තිබුණා විනා කිසිදු විදියකින් බාහිර රුව වෙනසකට ලක්වෙලා තිබුණෙ නැහැ. ඇය මා වෙනුවෙන් කෝපි කෝප්පයක් පිළියෙළ කරන්නට මුළුතැන්ගෙට ගියෙ ඉතාම කැමැත්තෙන්.ඇතැම්විට මුළුතැන්ගෙයි තනිවීම ඇගේ ගැහැණු හිත ඉල්ලා හිටින්න ඇති. ඒ වෙලාව තුල මා සමඟ කථාබහ කරන්න අවැසි ශක්තිය ඇය ඇති කර ගනීවි කියලා මට හිතුණා.

මං ඇය වෙනුවෙන් රැගෙන ආ පොත ඇගේ පියානෝවේ බඳ මත තබා මුළුතැන්ගෙට ඇවිදගෙන ගියා. ඇගේ වටොර දක්වා දිගු කෙස් කළඹ ඇය සෝදන බේසමේ යමක් පිරිසිඳු කරන විට කිසියම් රිද්මයකට පැද්දෙමින් හිටියා.දුලිනි මා වෙනුවෙන් රසවත් කැපුචිනෝ කෝප්පයක් පිළියෙළ කර තිබුණා. එය අතිශය පිළිවෙළ සහ පිරිසිදු කුඩා මුළුතැන්ගෙයක්. ඇතැම් පැලෑටි වර්ග සහ බැසිල් , ඔරිගානෝ වැනි කුළුබඩු ලෙස භාවිතා කරන සිඟිති පඳුරු කිහිපයක් වගා කළ මැටිපෝච්චි පෙළක් සෝදන බේසම අසළ කවුළුව මත තිබුණා. පුංචි රවුම් මේසෙ දෙපැත්තෙ අපි දෙන්නා වාඩිවෙලා හිටියා.මගේ ඇස් වල ආදරය උතුරා යමින් තිබුණා. ඒත් දුලිනිගෙ ඇස් වල තිබුණෙ චකිතය මුසු බියක්. ඒ එයාගෙ හැටි.

**මතු සම්බන්ධයි**


උපේක්ෂා සේනානායක ලියයි


අතුල උපසිරි කල්දෙමුල්ල ගේ සිතුවමින්